මගේ අංකය: 3/5/බඳවා ගැනීම්/vii
මානව සම්පත් කළමනාකරණ අංශය
රාජ්‍ය දැව සංස්ථාව
2026.08.12

සාමාන්‍යාධිකාරි,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්,
සහකාර සාමාන්‍යාධිකාරිවරුන්,
කළමනාකරුවන්,
ප්‍රාදේශිය කළමනාකරුවන්,
නියෝජ්‍ය කළමනාකරුවන් (ගෘහ භාණ්ඩ සංකිර්ණ /විමර්ශන / යාන්ත්‍රික ඉංජිනේරු),
ඒකක ප්‍රධානින්,
සංස්ථාවේ සියළුම සේවකයින් වෙත.`

## පුරප්පාඩු / ප්‍රසිද්ධ දැන්වීම

රාජ්‍ය දැව සංස්ථාවේ පහත සඳහන් තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරිම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

ඒ අනුව අයදුම්පත් 2026.08.28 දින හෝ ඊට පෙර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් හා පාලන) වෙත ලැබෙන සේ එවිය යුතු අතර තැපැලේ දි අස්ථාන ගතවන අයදුම්පත් පිළිබඳව වග කියනු නොලබන බව කාරුණිකව දන්වමි.

අභ්‍යාන්තර අයදුම්පත් මේ සමග අමුණා ඇති අකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කර අංශ ප්‍රධානියා / ප්‍රදේශිය කළමනාකරු/ ඒකක ප්‍රධානි මගින් ඉදිරිපත් කළ යුතුය. අසම්පූර්ණ හා ප්‍රමාද වි ලැබෙන අයදුම්පත් පූර්ව දැනුම් දිමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අනියම් හෝ වෙනත් පදනමක් මත සේවයේ නියුතු පුද්ගලයින්ට බාහිර සුදුසුකම් යටතේ අයදුම් කළ හැකිය. ඔවුන් විසින් මෙම අයදුම්පත් පෞද්ගලිකවම බාහිර අයදුම්කරුවෙකු වශයෙන් එවිය යුතු අතර සංස්ථාව මගින් එවිමෙන් වැළකි සිටිය යුතු බව ද අවධාරණය කරමි.

සියළුම අයදුම්කරුවන් සම්බන්ධ සේවා ඇගයීම් වාර්තාවක් අංශ ප්‍රධානීන් විසින් **රහස්‍යව** මා වෙත ඉදිරිපත් කළ යුතු බව වැඩිදුරටත් දන්වා සිටිමි.

# 1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) - *(HM 1-2)*

### සුදුසුකම් (පහත 1 හෝ 2 )

**<u>බාහිර අයදුම්කරුවන් සඳහා</u>**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍ය / ගිණුම්කරණය/ වාණිජ්‍ය / ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබිම.

සමඟ

අදාල කෙෂත්‍රයේයේ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ තනතුරට අදාල විෂය ක්ෂෙත්රයටගැලපෙන්නාවූ, පිළිගත් වරලත් වෘත්තිය ආයතනයක ආශ්රිත සාමාජිකත්වයක්(Associate Membership) ලබා තිබීම

**සහ**

ප්‍රථම උපාධි සුදුසුකම ලබාගැනිමෙන් පසු සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක" කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15)ක පළපුරුද්දක් ලබා තිබීම

**හෝ**

**2.** තනතුරට අදාල විෂය ක්ෂෙත්‍රයට ගැලපෙන්නාවූ , පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

**සහ**

ප්‍රථම උපාධි සුදුසුකම ලබාගැනිමෙන් පසු සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක" කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15)ක පළපුරුද්දක් ලබා තිබීම

## <u>අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා</u>

## සුදුසුකම් ( පහත 1 හෝ 2 )

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම
2. කළමනාකාර (MM 1-1) සේවා ගණයෙහි තනතුරක අවම වශයෙන් වසර පහක (07)ක අදාල විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

- **වැටුප් පරිමාණය** : HM 1-2 – 2025 රු. (143,120/- – 4,100/- × 15 = 204,620/-)
  **( කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/ 2025 හි II උපලේඛනය අනුව 2025.01.01 දින සිට)**

- **වයස් සීමාව** : **වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.**

- **බඳවා ගන්නා ආකාරය**

සුදුසුකම් ලත් අයදුම්කරුවන් විධිමත් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු ප්‍රමාණය මත තෝරා ගැනිම සිදු කෙරේ.

- **ඉහත තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දිම පහත පරිදි වේ.**

| | |
|---|---|
| අදාල අතිරේක පළපුරුද්ද | -ලකුණු 30 |
| අදාල අතිරේක අධ්‍යාපන / වෘත්තිය සුදුසුකම් | -ලකුණු 30 |
| අනෙකුත් කාර්ය සාධනයන් හා කුසලතා | -ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේදි කාර්යය සාධනය | -ලකුණු 25 |
| | උපරිම ලකුණු 100 |

- **ස්ථිර කිරීම**

බාහිර අයදුම්කරුවන් අතරින් පත්කරනු ලබන නිලධාරියෙකු වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලබන අතර, ඔහු / ඇය පරිවාස කාලය තුළ රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ගොස් තිබේ නම් පරිවාස කාලය අවසානයේදී සේවයේ / තනතුරේ ස්ථිර කරනු ලැබේ. සුදුසුකම් ලැබීමේ සේවා ගණයේ තනතුරක ස්ථිර කර සිටින අභ්‍යන්තර අයදුම්කරුවන් එක් වසරකට වැඩ බැලීමේ කාලසීමාවකට යටත් කෙරේ.

## 2. සහකාර සාමාන්‍යාධිකාරි(කළමනාකරණ තොරතුරු පද්ධති) *(HM 1-1)*

### සුදුසුකම් (පහත 1 හෝ 2 )

<u>බාහිර අයදුම්කරුවන් සඳහා</u>

- <u>අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්</u>

**1.** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු තාක්ෂණ/ පරිගණක විද්‍යාව/ පරිගණක ජාලකරණය හෝ කළමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**සමඟ**

අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නාවූ , පිළිගත් වරලත් වෘත්තිය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් (Associate Membership) ලබා තිබීම.

**සහ**

ප්‍රථම උපාධි සුදුසුකම ලබා ගැනීමෙන් පසු සංස්ථාවක , ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ " තනතුරක අවම වශයෙන් වසර දහතුනක (13) ක පළපුරුද්දක් ලබා තිබීම

**හෝ**

**2.** තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ , පිළිගත් වරලත් වෘත්තිය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

**සහ**

සංස්ථාවක , ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ " තනතුරක අවම වශයෙන් වසර දහතුනක (13) ක පළපුරුද්දක් ලබා තිබීම

<u>**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**</u>

### සුදුසුකම් ( පහත 1 හෝ 2 )

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම
2. කළමනාකාර (MM 1-1) සේවා ගණයෙහි I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05)ක අදාල විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

- **වැටුප් පරිමාණය** : HM 1-1 – 2025 රු(140,640/- – 4,100/-× 15 = 202,140/-)
  **( කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/ 2025 හි II උපලේඛනය අනුව 2025.01.01 දින සිට)**

- **වයස් සීමාව** : **වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.**

- **බඳවා ගන්නා ආකාරය**

  සුදුසුකම් ලත් අයදුම්කරුවන් විධිමත් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු ප්‍රමාණය මත තෝරා ගැනීම සිදු කෙරේ.

- **ඉහත තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීම පහත පරිදි වේ.**

| | |
|---|---|
| අදාල අතිරේක පළපුරුද්ද | -ලකුණු 30 |
| අදාල අතිරේක අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් | -ලකුණු 30 |
| අනෙකුත් කාර්ය සාධනයන් හා කුසලතා | -ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේදී කාර්යය සාධනය | -ලකුණු 25 |
| | උපරිම ලකුණු 100 |

- **ස්ථිර කිරීම**

බාහිර අයදුම්කරුවන් අතරින් පත්කරනු ලබන නිලධාරියෙකු වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලබන අතර, ඔහු / ඇය පරිවාස කාලය තුළ රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ගොස් තිබේ නම් පරිවාස කාලය අවසානයේදී සේවයේ / තනතුරේ ස්ථිර කරනු ලැබේ. සුදුසුකම් ලැබීමේ සේවා ගණයේ තනතුරක ස්ථිර කර සිටින අභ්‍යන්තර අයදුම්කරුවන් එක් වසරකට වැඩ බැලීමේ කාලසීමාවකට යටත් කෙරේ.

## වෙනත් ප්‍රතිලාභ

- සේවකයන් සහ යැපෙන්නන් සඳහා වෛද්‍ය රක්ෂණාවරණ
- වාර්ෂික ප්‍රසාද දීමනා
- පැමිණීමේ දිරිදීමනාව
- සංස්ථා ණය පහසුකම්
- සේ.අ.අ. සහ සේ.භා.අ. සඳහා දායකත්වය
- 1/2015 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රවාහන පහසුකම්

රාජ්‍ය දැව සංස්ථාව පිළිබඳ විස්තර, තනතුරුවලට අදාල රාජකාරි, වගකීම් සහ සේවා කොන්දේසි සහ ආදර්ශ අයදුම්පත්‍රය වෙත පිවිසීමට පහත සපයා ඇති **QR** කේතය ස්කෑන් **(Scan)** කරන්න.

**අයදුම්කල යුතු ආකාරය**

අයදුම්කරුවන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව සකස් කරන ලද අයදුම්පත සහ මූලික සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතිකවල සහතික කල පිටපත් 2026 අගෝස්තු මස 28 වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි **සභාපති, රාජ්‍ය දැව සංස්ථාව, අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත එවනු ලබන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

සැ.යු - අපැහැදිලි, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර එවීමට ප්‍රමාද වූ හෝ මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ .

**සභාපති - රාජ්‍ය දැව සංස්ථාව**